# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2195/32 - 2020 සැප්තැම්බර් මස 30 වැනි බදාදා - 2020.09.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ආඬිඅම්බලම ජල කුළුණට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතාව අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

5/3/GQ/03.

*උපලේඛනය*

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 155 B, නැගෙනහිර ආඬිඅම්බලම ග්‍රාම නිලධාරී වසමේ, ආඬිඅම්බලම ගමේ පිහිටි මේ සමග එවන අංක GA/KAT/2019/01 ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර B ලෙස පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0555 ක් පමණ වන මුවකිරියගොඩැල්ල නැමති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කසි 511204 කලාප 01 සහ මෙම පිඹුරේ කැබලි අංක A ; |
| *නැගෙනහිරට* | : | කසි 511204 කලාප 01, මෙම පිඹුරේ කැබලි අංක A සහ කසි 511204 කලාප 02 ; |
| *දකුණට* | : | කසි 511204 කලාප 01 ; |
| *බටහිරට* | : | කසි 511204 කලාප 01. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. S. A. J. A. H. සිල්වා,
නො. 171,
ආඬිඅම්බලම.

10 - 567

1A - G 33028 — 41 (2020/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට ජා-ඇල, ඒකල අපජල බැහැර කිරීමේ ව්‍යාපෘති අදියර 2 යටතේ ජා-ඇල අංක 12 පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

5/3/GQ/04

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 192, තුඩැල්ල බටහිර ග්‍රාම නිලධාරි වසමේ, ජා-ඇල ගමේ පිහිටි මේ සමග එවන දල සැලැස්මේ පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් පර්චස් 15 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල ; |
| *නැගෙනහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | දැලතුර පාර (අධිවේගී පිවිසුම් මාර්ගය - ජා-ඇල) ; |
| *බටහිරට* | : | වගුරුබිම |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. රුවිඳු පීරිස්,
අංක 16/2, රේමන්ඩ් පාර,
නුගේගොඩ.

10 - 568

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.